# හතරවන තේමාව - යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙව්සමිඳාණන් සමග ගැඹුරු සම්බන්ධතාවය

25

## 4.3. දෙවිඳුන් පසසමු සමිඳුන් වදනින්

යාච්ඤාව යනු කුමක් දැයි මේ වනවිට ඔබ අවබෝධ කරගෙන ඇත. යාච්ඤාවෙන් බිහිවන දෙව්මිනිස් සබඳතාව, ගැලවීමේ ඉතිහාසයේ දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇති වූ ගිවිසුම් කරා දිව යේ. එම සබඳතාව නව ගිවිසුමේ දී ක්‍රිස්තුන් වහන්සේගෙන් පූර්ණත්වයට පත් විය.

එම පූර්ණත්වය කරා වූ ගමනේ දී කිතු සමිඳුන් විසින් ඉදිරිපත් කරන ලද කන්ද උඩ දේශනාවත් ස්වාමිවාක් ආරාධනාවත් මූලික තැනක් ගනී. කන්ද උඩ දේශනාව යහපත් ජීවිතයකට අනුශාසනාවක් වන අතර ස්වාමි වාක් ආරාධනාව එම යහපත් ජීවිතය අත් කරගනු සඳහා දේව වරප්‍රසාද ඉල්ලා ගැනීමේ මාර්ගය යි.

**ක්‍රිස්තුන් වහන්සේ**
**තමන් වහන්සේගේ මුළු ජීවිත කාලය පුරාම කළ කී දේ, කිරීමට උවමනා කළ දේ**
**එනම් මනුෂ්‍යයා තම පියාණන් කරා රැගෙන යාමට**
**වුවමනා සියල්ලක්ම කැටි කරමින් උතුම් වූ යාච්ඤාව**
**එනම් ස්වාමිවාක් ආරාධනාව**
**මුළු මහත් සමාජයට දානය කළ සේක.**

යාච්ඤා අතරින් උතුම් ම යාච්ඤාව ස්වාමිවාක් ආරාධනාව වන අතර එම යාච්ඤාව බැහැපත් සිතින් හා විශ්වාසයෙන් යුතු ව උච්චාරණය කළ යුතු වන්නේ ය.

- ස්වාමිවාක් ආරාධනාව ඔබගේ මතකයට නගා ගන්න. එය බැහැපත් සිතින් මෙනෙහි කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

දැන් අපි ස්වාමීවාක් ආරාධනාවේ සහ උත්තම පූජක යාච්ඤාවේ (ජොහාන් 17) ඇති විශේෂ ලක්ෂණ පිළිබඳ ව සලකා බලමු.

- ස්වාමීවාක් ආරාධනාව ඉගැන්වූ යාච්ඤාවකි.
- උත්තම පූජක යාච්ඤාව ක්‍රිස්තුන් වහන්සේ තමන් විසින් ම කරන ලද යාච්ඤාවකි.

එහෙයින් උත්තම පූජක යාච්ඤාව, යාච්ඤාවේ පූර්ණත්වය විදහා දක්වයි. ශ්‍රාවකයන් සඳහා යැදුම යනුවෙන් ද හඳුන්වනු ලබන උත්තම පූජක යාච්ඤාව කිතු සමිඳාණන්ගේ ජීවිතය හා දූතික සේවාවේ අපූර්ව සම්පිණ්ඩණයකි.

- ස්වාමීවාක් ආරාධනාවේ ආමන්ත්‍රණය පියාණන් වහන්සේ වෙතට යොමුවී ඇති අතර උත්තම පූජක යාච්ඤාවේ ද එසේම යොමුවී ඇත.

ස්වාමීවාක් ආරාධනාවේ "ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි ඔබගේ නාමය ආරාධිත වේවා!" යනුවෙන් ද උත්තම පූජක යාච්ඤාවේ "ඔබ මහිමයට පමුණුවනු ලබන පිණිස" යනුවෙන් ද සඳහන් වේ. දේව රාජ්‍යය ක්‍රිස්තුන් වහන්සේගෙන් පූර්ණත්වයට පත් වේ. දෙවි පියාණන් මහිමයට පත් වේ.

ක්‍රිස්තුන් වහන්සේ තමා දේව පුත්‍රයාණන් බව පැහැදිළි ව පැවසූ එක ම ස්ථානය උත්තම පූජක යාච්ඤාවේ ජොහාන් 17:2 වගන්තියෙන් හොඳාකාරව ම පැහැදිළි වේ.

> මන්ද ඔබ විසින් පුත්‍රයාණන්ට දෙන ලද සියල්ලන් හට සදාතන ජීවනය දෙන පිණිස සකල මනුෂ්‍යයා කෙරෙහි ආධිපත්‍යය ඔබවහන්සේ පුත්‍රයාණන්ට දුන් සේක.
>
> (ජොහාන් 17:2)

"ඔබගේ කැමැත්ත ඉටුවේවා" යි ස්වාමීවාක් ආරාධනාවේ සඳහන් ය. ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කළ බව උත්තම පූජක යාච්ඤාවේ පැහැදිලි ව සඳහන් වේ.

> ඔබ වහන්සේ මට බාර දුන් මෙහෙය සම්පූර්ණ කරමින් මිහිපිට ඔබ මහිමයට පැමිණ වීමි.
>
> (ජොහාන් 17:4)

ක්‍රිස්තුන් වහන්සේ තම දේව කාර්යය ඉටු කිරීම සඳහා මෙලොව ස්ථාපිත කළ කුඩා ශ්‍රාවක සංඝය වෙත ඔවුන්වහන්සේගේ අසීමිත ප්‍රේමයත් ඔවුන්ගේ වර්ධනය සඳහා කළ ප්‍රාර්ථනයත් උත්තම පූජක යාච්ඤාව තුළ අන්තර්ගත ය.

> මම ඔවුන් උදෙසා යාච්ඤා කරමි. ඔබ මට දුන් ඔවුන් උදෙසා මිස ලෝකය උදෙසා යාච්ඤා නොකරමි. මන්ද ඔව්හූ ඔබගේ ය."
>
> (ජොහාන් 17:9)

මෙයින් අදහස් වනුයේ ක්‍රිස්තුන් වහන්සේ තම ශ්‍රාවකයන් ගැන පමණක් සැලකිල්ල යොමුකොට ලෝකයා බැහැර කිරීමක් නොව ඔවුන්වහන්සේගේ සේවය ඉදිරියට ගෙන යාමට සිටින ශ්‍රාවකයන්ට ශක්තිය ලබාදීමක් බවයි.

ස්වාමිවාක් ආරාධනාවේ "නිරන්තර භෝජනය අද අපට දේවා" යනුවෙන්, සඳහන් වේ. මෙම භෝජනය ක්‍රිස්තුන් වහන්සේ හෙයින් අප නිතර දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමෙන් ක්‍රිස්තුන් වහන්සේ හා සම්බන්ධ වෙමු.

> පියාණනි, මා මෙසේ යාච්ඤා කරන්නේ ඔබ මා තුළ ද මා ඔබ තුළ ද සිටින්නාක් මෙන් ඔවුන් ද අප තුළ ඒකත්වයක් වන පිණිසත්, ඔබ මා එවා වදාළ බව ලෝකයා විශ්වාස කරනු පිණිසත් ය.
>
> (ජොහාන් 17:21)

ස්වාමිවාක් ආරාධනාවේ "අපට වැරදි කළ අයට අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද අපට කමා කළ මැනව." යනුවෙන් සඳහන් වේ. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අන්‍යයන්ට ප්‍රේම කිරීම හා කමා කිරීම උත්තම පූජක යාච්ඤාවේ ගැඹුරින් දක්වා ඇත.

> ඔබ මට ප්‍රේම කළාක් මෙන් ඔවුන්ටත් ප්‍රේම කළ බව ලෝකයා දැනගන්නා පිණිස ය.
>
> (ජොහාන් 17:23)

වැරදි කළ අයට කමා කිරීමත් එකෙකාට ප්‍රේම කිරීමත් අපගේ හදවතේ ගැඹුරින් අනුන් වෙත දක්විය යුතු ප්‍රේමය ප්‍රකාශ කිරීමකි.

ජේසු සමිඳාණන්ගේ උත්තම පූජක යැදුම අර්ථාන්විත වන්නේ ඔවුන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය තුළින් දේව රාජ්‍යය මහිමයට පත්වීම නිසා ය.

සියලුම අයහපත් හා අන්ධකාරයේ බලවේග දුරුවී ආදරය, සත්‍යය සහ සැබෑ ජීවිතය බිහිවීම නිසා ය. ඔවුන්වහන්සේ මහිමයට පත්වීම තුළින් අපෝස්තුළුවරු ශක්තිය හා ජීවනය ලැබූහ. දෙවි පියාණන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ සහ ශ්‍රාවකයන් අතර පවත්නා සම්බන්ධතා රටාව මත ශ්‍රාවකයන්ගේ පැවැත්ම හා ප්‍රගතිය රඳා පවතින බව ක්‍රිස්තුන් වහන්සේගේ ම මේ වදන්වලින් පැහැදිලි වෙයි.

> මම තවත් ලෝකයේ නොසිටිමි. එහෙත් ඔව්හු ලෝකයේ සිටිති. මම ඔබ වෙතට එන්නෙමි. සුවිශුද්ධ පියාණෙනි අප මෙන් ඔවුන් ද ඒකත්වයක් වනු පිණිස ඔබ මට දුන් ඔබගේ නාමයේ අනුහසින් ඔවුන් ආරක්ෂා කළ මැනව.
>
> (ජොහාන් 17:11)

මේ වදන්වලින් ක්‍රිස්තුන් වහන්සේ තම අපෝස්තුලුවරුන්ට අනන්‍යතාවයක් ලබාදුන් සේක. කිතු සමිඳුන්ගේ මේ යැදුම අනාගත ශ්‍රාවකයන් වෙත ද යොමු වී ඇත. ඒ

පරපුරෙන් පරපුරට උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගේ පැවැත්ම කෙරෙහි බලපාන්නේ ය. එසේ නම් වත්මන් සමාජයේ ශ්‍රාවකයන් වන අප සඳහට ම රැකබලා ගන්නා බව මෙම පාඨයෙන් ඔබට හැඟෙනවා ද? එසේ නම් අප කිසිවිටෙක කිසිදු දෙයකට භය විය යුතු නැත. හේතුව ඔවුන්වහන්සේ සදහට ම අප සමග වැඩ විසීම ය.

කිතුනුවන්ගේ යාච්ඤාව අප හදවත් තුළ ක්‍රියාකරන ශුද්ධාත්ම ඵලයකි. දෙවි පියාණන් වෙත අප සිත් හා හදවත් යොමු කරමින් යහපත් දේ අයැදීමකි. අප හදවත් තුළ දෙවි පියාණන්ගේ කැමැත්තට එකඟවීමට ඉඩ හැරීමකි.

**මේවා ඔබට කළ හැකිද?**

1. ස්වාමිවාක් ආරාධනාවේ ප්‍රධාන කොටස් අනුපිළිවෙලින් ලියා දක්වන්න.

2. ශු. ජොහාන් 17 පරිච්ඡේදය පරිශීලිනය කරමින් උත්තම පූජක යාච්ඤාවේ ප්‍රධාන කොටස් ලියා දක්වන්න.

3. ස්වාමිවාක් ආරාධනාවේ හා උත්තම පූජක යාච්ඤාවේ ඇති සමාන අසමාන කම් ගොනු කරන්න.